
Page 16 April 2013.qxd 28/05/2013 15:54 Page 1



**ඇත්ත කෙටි කතාව**

# ෂහ්! ලංකාවෙත් මෙහෙම නම්! (ලන්ඩන් ආ යාලුවාගේ කතාව)



**දැ**නට අවුරුදු විස්සකට විතර ඉස්සෙල්ලා ලන්ඩන් නුවරට අපේ දුරින් නෑයො වෙන කෙනෙක් ආවා, කාර් අමතර කොටස් මිළදී ගන්න බලාගෙන. එයාට කොළඹ පංචිකාවත්තෙ මෝටර් ස්පෙයාර් පාට්ස් සාප්පුවක් තිබුණා. සෑහෙන යමක් කමක් තිබුණු ඔහු ජීවත්වුණේ කොළඹ හතේ. එයා ලන්ඩන් ඇවිල්ලා තිබුණේ එංගලන්තයේ මැද ප්‍රදේශයක තිබුණු රථවාහන අමතර කොටස් නිපදවන සමාගමක ආරාධනය පිට.

මගේ මේ යාලුවා ඊට කලින් ලන්ඩන් ඇවිත් තිබුණේ නෑ. ඉතින් එන දවසෙ මම හිත්රෝ ගුවන් තොටුපළට ගියා එයාව එක්ක ගෙන එන්න. එයාට දවස් දෙක තුනක් අපේ ගෙදර නැවතිලා යන්න වෙන නිසා මම අපේ ගෙදර කාමරේකුත් ලෑස්ති කරල තියලයි එයාපෝට් ගියේ.

මම යාලුව ව දැක්කෙ හුඟ කාලෙකට පස්සෙ වුනත් දැක්ක ගමන් මම එයාව අඳුරගත්ත. එයා එච්චර වෙනස්වෙලා නෑ. හැබැයි එයාට බැරිවුණා මාව එකපාරටම අඳුරගන්න. මම මිනිහව පිළිඅරගෙන එයාර් පෝට් එකෙන් එළියට එන්න ඉස්සරවෙලා ඇහුවා සල්ලි එහෙම මාරුකරගන්න ඕනද කියලා. ඒ දවස්වල වෙන රටකට යනකොට ගෙනියන්නෙ ට්‍රැවලර්ස් චෙක්ස් හින්දයි මම එහෙම ඇහුවෙ. එයා ටිකක් සැරෙන් වගේ නෑ කියලා, අතේ තිබුණු පුංචි ලෙදර් බෑග් එකක් තද කරලා අල්ලගත්තා. මං හිතන්නේ ඒකෙ තමයි සල්ලි තියෙන්න ඇත්තෙ. මම සල්ලි ගැන අහපු ගමන් එයා බයවුණා.

කොහොම හරි එයාවත් දාගෙන මම ගෙදර ආවා. අපේ බිරිඳ රසට කෑම උයලා තිබුණා. කෑමට කතා කළත් වැඩි කැමැත්තක් පෙන්නුවෙ නෑ. පස්සෙ කන්නම් කිව්වා. මම හිතුවා ගමන් කෙඩෙත්තු නිසා වෙන්න ඇති කියලා. ටිකක් ඇලවෙන්න ඕන කියලා අර වෙන්කරපු කාමරේට ගියා.

විනාඩි දහයකින් විතර යාලුවා ටොයිලට් එකට යනව ඇහුණා. එළියට ඇවිල්ලා මගේ නම කියලා කතාකරලා මාව ටොයිලට් එක ඇතුළට එක්ක ගිහිං වොෂ් බේසිං එක පෙන්නුවා. මගෙ අම්මෝ! ඒකෙන් එකයි ලේ. එයාට වමනෙ ගිහිල්ලා ලේත් එක්ක. එතකොටයි කිව්වෙ ලිවර් එකේ අමාරුවක් තියනවා කියලා. මමත් දුක්වුණා යාලුවා මැරේද කියලා. කෝකටත් මම යෝජනා කළා, මේ තත්වෙ නම් ඉතින් බලං ඉඳලා බෑ, ඉස්පිරිතාලෙ යමු කියලා. යාලුවා කැමති වුණා. මම එයාව උතුරු ලන්ඩනයේ රෝයල් ෆ්‍රී කියන රෝහලට අරගෙන ගියා. ඇඩ්මිට් කරනකොට එතනින් කිව්වා එයා එහේ නිත්‍ය පදිංචි කෙනෙක් නොවන නිසා ගෙවන්න වෙනවා කියලා. ඩිපොසිට් එකක් බඳින්න කිව්වා. ඒ පාර අර එයාගෙ අතේ තිබුණු බෑග් එකෙන් පවුම් නෝට්ටු මිටියක් අරගෙන පවුම් දාහක් රෝහලට බැන්දා. වාට්ටුවට ගත්තයින් පස්සෙ මම ගෙදර ආවා, හවසට බලන්න එනව කියලා. මිනිහගෙ තත්වෙ හැටියට මගේ හිතට බයකුත් ඇතිවුණා මැරෙයිද කියලා.

හවස් වෙලා මං ගියා ලෙඩා බලන්න, බත් මුලකුත් බැඳගෙන. හවස කිව්වට රෑ අටට විතර ඇති. සමර් කාලෙ හන්දා එතකොටත් හොඳට ඉර පායලා, හරි එළියයි. එයාගෙ අතට පයට මොනවද මැෂින් වගයක් හයි කරලා තිබුණා. සේලයින් බෝතලේකුත් ඇඳ ළඟ එල්ලෙමින් තිබුණා. මිනිහා මාව දැක්ක ගමන් ඇහට කඩාගෙන පැන්නා මොකද පරක්කු වුණේ කියලා. මම මුකුත් කිව්වෙ නැතුව ජනේලෙන් එළිය බලං හිටියා. ඒ කාලෙ සමර් (උණුසුම් සෘතුව) නිසා කරුවල වැටුණෙ රෑ දහයට විතර. යාලුව මගෙන් වෙලාව ඇහුවා. මම කිව්වා රෑ අටයි කියලා. එයා ඇහුව, එහෙනම් කොහොමද දවල් වගේ මේ තරම් එළිය? කියලා. මම කිව්වා මේ කාලෙ ඉර බහින්නෙ රෑ දහයත් පහුවුනාම කියලා.

එතකොට එයා එකපාරටම කිව්වා, “ ෂහ්! ලංකාවෙත් මෙහෙම නං, රෑ දහය වෙන කල් අපේ සාප්පුව ඇරලා තියන්න තිබුණ නේ ” කියලා.

ලන්ඩන් ඉඳලා යාළුවා ලංකාවට ගිහිල්ලා වැඩි දවසක් ගියේ නෑ මැරුණ බව ආරංචි වුණා. මට ඒ වෙච්ච දේ ගැන මතක් වෙන හැම වෙලාවකම හිතෙන්නේ මිනිස්සු බොහොම දෙනෙක් සල්ලි හොයන්නම මේ දුවන දිවිල්ලේදි කොපමණ ලැබුණත් සෑහීමකට පත්වෙනවද කියලා. ඒ ධාවනයේදි තමන්ගෙ ශරීර සෞඛ්‍යයට දෙන්නෙ ඉතාව නොවටිනා තැනක්. සෑහෙන ධනවතෙක් ව සිටි මගේ යාලුව එයාගෙ අක්මා ආබාධය ගැන සැලකිලිමත් වුනා නම් තවමත් ජීවතුන් අතර ඉඳීවි කියලා මට හොඳට විස්වාසයි. මට හැම තිස්සෙම මතක් වෙනවා මැන් එංගලන්තෙ සමර් ටයිම් එක ගැන ලෙඩ ඇඳේ ඉඳගෙන කියපු කතාව.

“ ෂහ් ලංකාවෙත් මෙහෙම නං රෑ දහය වෙන කල් සාප්පුව ඇරලා තියන්න තිබුණ

**♦ නීතිඥ අනුර හෑගොඩ London**




# ඉන්දියාව කිසිදා අපේ මිතුරෙකු නොවීය, නොවේ.

**අ**පට කිට්ටුම රට ඉන්දියාව බව කවුරුත් දන්නවා. ඒත් කොච්චර දුරද කියලා හුඟ දෙනෙක් හිතලා නැහැ. වැල්වැටිතුරේ ඉඳලා අහල තියන විදියට හැතැප්ම **14** යි. අහංගම ඉඳලා වැලිගමට තියන දුර වගේ. බස් එකකින් ගියොත් විනාඩි 20 කින් යන්න පුළුවන්. ඉස්සර ප්‍රභාකරන්ගෙ වයසේ වැල්වැටිතුරේ, යාපනේ හිටි දෙමළ තරුණයො, මාළු අල්ලන මිනිස්සු බෝට්ටු වලින් ඉන්දියාවෙ මදුරාසියට ගිහිං, එම්. ජී. ආර්. ගෙ පික්චර් **9. 30** ෂෝ එක බලල, ඒ රෑම ආපහු එන බව මම අහලා තිබුණා. මම මේ කිව්වෙ ඉන්දියාව ලංකාවට කොච්චර කිට්ටුද කියන එක පෙන්නන්න.

ඊළඟට අපි සංස්කෘතික වශයෙනුත් සෑහෙන කිට්ටුවෙන් ඉන්නෙ. ශරීර වර්ණයෙන්, කෑම බීම, යොදන තුනපහ, වැවෙන පළතුරු, එළවළු මේ හැම දෙයක්ම පාවිච්චි කිරීම අතින් අපි එකම විදියයි. තිස්තුන් කෝටියක් දෙවි ගොල්ලන්ට බාරහාරවීම, පුදපූජා අපට කෙලින්ම ඉන්දියාවෙන් බෝවෙච්ච දෙයක්. ඒ සේරටම වැඩිය අපේ රට ඉහළින් අදහන ආගමික ශාස්තෘන් වහන්සේගේ උපන් භූමිය ඉන්දියාව. ඒ අතින් බැලුවහමත් ඉන්දියාවට අපේ තියෙන්නෙ ලොකු ගෞරව සම්ප්‍රයුක්ත බැඳීමක් සහ හිතවත්කමක්. මම මේ දේවල් කිව්වෙ ඉන්දියාව සමඟ අපේ තියන සමානකම පෙන්වන්න.

ඒ වුනාට මෙන්න මෙහෙම ප්‍රශ්නයකුත් අපි අපෙන්ම අහන්න ඕන. මෙච්චර සමානකම් තිබුනත් ඇත්තටම අපි ඉන්දියාව ගැන දන්නවද කියලා. පිළිතුර නෑ කියන එක. අපි ඉන්දියාව ගැන ඇත්තටම දන්නෙ නෑ. අපි හිතාගෙන ඉන්න ඉන්දියාව නෙවෙයි ඒ තියෙන්නෙ. රටක් කිව්වම අපි කතාකරන්නෙ රටේ තියන ගස් කොළන් ගැන, භූ විෂමතා ලක්ෂණ ගැනම පමණක් නෙවෙයි, ඒ රටේ ඉන්න මිනිස්සු ගැන. ඒ රටේ ආණ්ඩුව ගැන. ඒ ආණ්ඩුව ක්‍රියාත්මක කරන මිනිස්සු ගැන. ඒ නයින් බලද්දි ඇත්තට එහේ මිනිස්සු ක්‍රියා කරන්නෙ කොයි විදියද කියලා අපට හිතාගන්න බෑ. ඒත් අපි හිතිය යුතුයි. බුදුන් වහන්සේ වැනි ශාස්තෘවරයෙක් ඉපදිච්ච රටක් ඒ ගැන කොච්චර ආඩම්බර වෙන්න ඕනද? ඒත් දඹදිව වඳින්න ඉන්දියාවට ගිය අය දන්නවා, ඉන්දියාව බුදුන්ට සලකන්නෙ තුට්ටු දෙකට බව. ධර්මපාලතුමා නොහිටියා නම් බුද්ධගයාව කුත් නැහැ. එහෙනම් හින්දුකාරයො, මුස්ලිම්කාරයො ශ්‍රීමහා බෝධිය කපලා දරට අරගෙන හුඟක් කල්.

ඕනම රටක ත්‍රස්තවාදියො බෝ වුනා නම් ඒ රටේ ආණ්ඩුවටවත් ජනතාවටවත් යහතින් ඉන්න හම්බ වෙන්නෙ නෑ කියන එක කවුරුත් දන්න දෙයක්. ත්‍රස්තවාදී උවදුරු රාශියක් කාලයක් තිස්සේ තියන ඉන්දියාව කාටත් වඩා ඒක දන්නවා. ඉන්දියාව මහා පාහර වැඩක් කළා. කොටි ත්‍රස්තවාදීන්ට කඳවුරු හදල දීලා උන්ව ඉන්දියන් බුද්ධි අංශය යොදවලා පුහුණු කළා. ඒක ලංකාවෙ මිතුරෙක් කරන වැඩක්ද? ප්‍රභාකරන් අල්ලන්න ඕන්න මෙන්න කියලා තියෙද්දි 1989 දි උඩින් ඇවිත් පරිප්පු දාලා වැඩේ කෑවා. එච්චර විතරක් නෙවෙයි ඉන්දියන් මහකොමසාරිස් දික්සිත් පස්සෙ ලියූ පොතේ සඳහන් වෙනවා, එදා ලංකාව ඒ පරිප්පු දැමීමට විරුද්ධ වුනා නම් ඉන්දියානු ගුවන් හමුදාව එදාම කොළඹට පහර දී ලංකා රජයේ නායකයන් ඝාතනය කරන්නටත් සූදානමක් තිබූ බව. සැටලයිට් මගින් කොළඹට පහරදෙන තැන්ද ලකුණු කරගත් බවත් දික්සිත් කියනවා. ඇත්තටම මුන් යාළුවොද? එදා ප්‍රභාකරන් අල්ලලා විනාශ කළා නම් යුද්ධය තව අවුරුදු 16 ක් ඇදෙන්නෙ නෑ. එහෙනම් ජීවිත දහස් ගණනක් විනාශවීම වළක්වා ගන්න තිබුණා. මිතුරෙක් හැටියට පෙන්නලා ඉන්දියාව කොච්චර ද්‍රෝහි කමක්ද ඒ කළේ. විජිතමුණි රෝහණ සිල්වා රජීව් ගාන්ධිට ගහපු රයිපල් බට් පාර මට නම් පවුම් කෝටියක් වටිනවා. අපේ අභිමානය වර්තමාන ලෝකය ඇත්තටම දැකගත්තෙ එදා.

ඉන්දියාව බලන්නෙ ඒ කලාපයේ අයියා වෙන්න. ඉන්දියාවෙන් අහන්නෙ නැතුව අපට වෙන කිසි රටක් එක්ක යාළු මිත්‍රකම් පවත්වන්න, වෙළඳ ගණුදෙනු කරන්න බෑ. අපි චීනෙත් එක්ක යාළුය කියලා ඉන්දියාවට තද වෙනවා. කවදාවත් අපේ දියුණුවක් දකින්න ඉන්දියාව කැමති නෑ. අපි ආර්ථික අතින් ශක්තිමත් වෙනවට, ලෝකයේ අපේ සම්බන්ධකම් පුළුල් කරගන්නවට උන් කැමති නෑ. අපේ හැමදේකටම වගේ අපේ ත්‍රස්තවාදී ප්‍රශ්නයටත් ඉන්දියාව මුල හිටම අතදාලා වැඩේ කෑවා. ඊට පස්සෙ දැන් කියනවා ඒ ගොල්ල කියන විසඳුම අපේ රටේ ප්‍රශ්නෙට ගේන්නලු. ඒ මොකටද? අපේ ප්‍රශ්න අපට විසඳගන්න ඇහැකි. අපි මොකටද ඉන්දියාවෙන් අහන්නෙ? ඉන්දියාව විසාල රටක්. ඒ ප්‍රාන්ත රාජ්‍ය ක්‍රමය එහාට හොඳයි. අප වගේ අල්ලක් විතර රටකට ඒක වැඩක් නෑ. ඔය හදන්නෙ ඊළම වෙන විදියකට ලංකාවට සෙට් කරන්න.

කොච්චර නෑ කිව්වත් ඉන්දියාව කැමතියි ලංකාව කෑලිවලට කැඩෙනවා නම්. අපේ රටේ ඉන්න නායකයොත් තේරුම් ගන්න ඕන ඔය 13 වෙනි සංශෝධන කෙහෙල්මල් පැත්තකට වීසිකරලා ඔය තියන විදියට ලංකාව පාලනය කරන්න. භාසාවෙ සම තත්ව යක් දීලා තියනවා නම්, ආර්ථිකය හා ඉපයීම් කාටත් කරදරයක් නැතුව සමසේ කරගන්න පුළුවන් නම් තවත් මොන සංශෝධනද? ඉන්දියාවට බම්බු ගහගන්න කියලා කට ඇරලා කියන්න බැරිද? මතක තියාගත යුතු මූලිකම දේ මේකයි. ඉන්දියාව අපේ යාලුවෙක් නම් නෙවෙයි. එච්චරයි ! මට මීට වැඩිය කියලා දෙන්න බෑ.

***දේශප්‍රේමී හිතවතුනි,***

**මේ මගේ අවසාන ලියුම. මින්පසු මේ තීරුව මට ලියන්න ලැබෙන්නෙ නෑ. මේ තීරුවෙන් මම මෙපමණ කල් කියපු දේවල් හිතටගන්න. අප රටේ යහපත, ආරක්ෂාව ගැන නිතර හිතන්න. ඒ අනුව වැඩකරන්න. ඔබට සුබ අනාගතයක් පතමින් මම නවතිනවා.**

**♦ වෙලේගෙදර රාළ London UK**

# ඒකාන්තික ප්‍රේමය හෙවත් කොන්දේසි විරහිත ආදරය

**(Unconditional Love)**


**ආ**දරය අප සැමටම අවශ්‍ය දෙයකි. කුඩා බිළිඳාගේ පටන් තරුණ මහලු කාට වුවද ආදරය ලැබීම ඉමහත් ආශ්වාදයකි. ආදරය අප නොදැනුවත්වම කාල්පනික සුන්දර ලොවකට අප ගෙනයයි. එසේ වුවද උසස්තම ආදරය රඳා පවතින්නේ කොන්දේසි නැති ආදරය මතය. එසේ නැතිව ලබන ආදරය අප පැටලිලි සහගත තත්වයට පත්කරයි. ශරීරයට ආහාර පාන හා පිරිසිදු වාතාශ්‍රය අවශ්‍යසේම සිතට ආදරය ද උවමනා වන්නේ ය.

අප ළමා කාලයේදී වැඩිහිටියන් බලාපොරොත්තු වන අන්දමට පිරිසිදුව, හොඳින් ඇඳපැළඳ, නිහඬව, කීකරුව ළමයෙක් සිටින තාක් කල් ඔහුට හොඳ ළමයා යයි කියති. ඔහු අන් අයගේ ආදරයට භාජනය වේ. එසේම නරක යයි සම්මත දෙයක් කළ කෙනෙකු වැටෙන්නේ නරක හෝ වැදගැම්මකට නැති ළමයින් යනුවෙන් හඳුන්වන ගොඩටය. මෙහිදී මේ තත්වයන් ඇතිවීමට බලපෑවේ කොන්දේසි සහිත ආදරයයි. මේ අනුව එම ආදරය ව්‍යාජ ආදරයක් බව සැබැවින්ම හැඟේ.

සැබෑ ආදරය කෙනෙකුට සතුට, සහනය සහ ආරක්ෂාව ගෙන දෙයි. සිත තෘප්තියෙන් පුරවයි. සැබෑ ආදරයේදී එයින් අපට ලැබෙන වාසිය, ලාභය ගැන නොසිතිය යුතුය. එය හරියට අපේ ආදරයට අප ගාස්තුවක් බලාපොරොත්තු වෙනවා හා සමානය. අපේ මෝඩකම්, අපෙන් වන වැරදි, එසේම බලාපොරොත්තු සුන්කිරීම් ආදිය අප කරද්දීත් කිසිවෙක් අප ගැන සානුකම්පිකව බලත් නම් එය කොන්දේසි වලින් තොර ආදරයකි. එම ආදරය ඉතා බලගතුය. හිත්වේදනා නැතිකර ගැන්මට හා සමීප සබඳතා ගොඩනගා ගැන්මට එයට හැකියාව තිබේ.

කොන්දේසි විරහිත ආදරය නොලැබෙන විට එම අඩුව පිරිමසා ගැන්මට කෙනෙකු මත්පැන් සහ මත්කුඩු භාවිතයටද, ලිංගික තෘප්තිය ලැබීම ආදියටද යොමුවන්නට පුළු වන. සැබෑ ආදරයෙන් ලැබෙන සැනසිල්ල ඒවායින් නොලැබේ. එසේම එම ආදරය ලැබීම බොහෝ ප්‍රශ්න නිරාකරණය කර ගැන්මට ඉවහල් වන්නේය. විශේෂයෙන් ඉන් පවුලේ සමගිය ඇතිවීම, විවාහ දික්කසාදවලින් තොරවීම සහ හික්මුණු විනීත දරුවන් පවුල්වලට ඇතිවීම ආදිය සිදුවෙයි.

ඒකාන්තික ආදරය හෝ ඒමත පදනම් වුණු මිතුදම දීර්ඝකාලයක් පුරා පවත්වා ගෙන යන්නට නම් කෙනෙකු සම්ප්‍රදායික ප්‍රඥාවට (Conventional Wisdom) වඩා භාව විෂයක බුද්ධියෙන් (Emotional Inteligence) පිරිපුන් විය යතුය. එය කොන්දේසි නැති ආදරයට අවශ්‍යම දෙයකි. එලෙස බුද්ධි වර්ධනය කරගත් කෙනෙකුට තමා ආදරය කරන හෝ හිවත්කම් දක්වන පුද්ගලයා අතින් වරදක් වුවද එය තේරුම්ගෙන කිසිවක් නොවූවා සේ සිත එකලස් කරගත හැකිය. පැරණි



ග්‍රීක පඬිවරයෙකු එය මෙසේ දක්වා තිබේ.

“ ඔබ මාකෙරෙහි දක්වන කොන්දේසි විරහිත ආදරය නිසා මිනිස් ස්වභාවය කරණකොට ගෙන මා අතින් සිදුවන වැරදි ඔබ සැලකිල්ලට නොගනී. මගේ අදහස් ඔබේ අදහස්වලට වඩා වෙනස් විය හැකිය. එහෙත් අපේ ආදරයට හෝ මිතුදමට එය කිසිසේත් බාධාවක් නොවන්නේය.” (Your unconditional friendship and love overlooks my human faults and allow some views to differ. But our friendship and love never halts.)

**♦ මහාචායර්‍ය සම්පත් ඇන්සන් ප්‍රනාන්දු**
**Essex UK**